1991 අංක ...02....... දරන පරිවාස හා

ළමාරක්ෂක ප්‍රඥප්තිය

අනාථ, අත්හළ සහ අසරණ ළමයින් සඳහා රැකවරණය හා ඔවුන්ගේ අවශ්‍යතා සැපයීම සඳහා ද ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම සඳහාද විධිවිධාන සැලසීම පිණිස ද එවැනි ආයතන පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය, 1991 අංක ...02....... දරන පළාත් සභා පරිවාස හා ළමාරක්ෂක ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

## 1වන කොටස - පරිපාලනය

ලේකම්වරයා පරිපාලනය භාරව සිටිය යුතු බව.

2. (1) (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පරිවාස හා ළමාරක්ෂක විෂයභාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් බලය පවරන ලද (මෙහි මින්මතු "බලයලත් නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් නිලධරයකු හෝ මේ ප්‍රඥප්තියේ පරිපාලන කටයුතු භාරව සිටිය යුතුය.

(2) ලේකම්වරයා හෝ යම් බලයලත් නිලධරයකු හෝ ඉහතකී කර්තව්‍යවලට අමතරව ස්වේච්ඡා සංවිධානයේ (මෙහි මින්මතු "රෙජිස්ට්‍රාර් වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) රෙජිස්ට්‍රාර්වරයා වශයෙන්, කටයුතු කළ හැකිය.

(3) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා තමාට සහාය වීම පිණිස අවශ්‍යයයි ලේකම්වරයා විසින් සලකනු ලැබිය හැකි නිලධරයන් සහ සේවකයන් යම් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය හැකිය.

(4) යම් නිලධරයකු හෝ සේවකයකු පත් කිරීම, මාරුකිරීම සහ සේවයෙන් පහ කිරීම, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියට අනුකූලව කළ යුතුය.

(5) මේ වගන්තිය යටතේ පත්කරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ඔහුගේ කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම, ලේකම්වරයාගේ අධීක්ෂණය හා පාලනය යටතේ කරනු ලැබිය යුතුය.

## 11වන කොටස - පර්වාස හා ළමාරක්ෂණය

පරිවාස ඒකකය.

3. මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව, වරදකරුවන් පරිවාසභාරයට පත් කිරීමේ ආ ඥාපනත (24වන අධිකාරය) යටතේ අදාළ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් පරිවාස ඒකකයක්, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පරිවාස ඒකකයක් ලෙස සැලකිය යුතුය.

පරිවාස නිලධරයා.

4. (1) යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබුවකු පිළිබඳ අධීක්ෂණය භාරව සිටීම සඳහා, දකුණු පළාත් සභා සීමාවක් ඇතුළත පිහිටි යම් අධිකරණයක් විසින් පත් කරන යම් පරිවාස නිලධරයකු, යම් කාරනයකට අදාල විශේෂ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන අධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරනු ලැබුවහොත් මිස, දකුණු පළාත් සභා සීමා ඇතුළතට ගැනෙන අධිකරණ කොට්ඨාශයේ පරිවාස ඒකකයකට පත් කරන ලද නිලධරයකු විය යුතුය.

එසේ වුවද, ලේකම්වරයා විසින් හෝ යම් බලයලත් නිලධරයකු විසින්, එවැනි වරදකරුවකු, ඒ වරදකරු පදිංචිව සිටින්නේ යම් ඒකකයක ප්‍රදේශය ඇතුළත ද, ඒ ඒකකයට අනුයුක්ත පරිවාස නිලධරයකුගේ භාරයට පත්කළ හැකිය.

(2) ලේකම්වරයා වෙත හෝ යම් බලයලත් නිලධරයකු වෙත යොමු කරන ලද කාරණයකට විෂය වී ඇති ළමයකු, ලේකම්වරයා විසින් හෝ බලයලත් නිලධරයා විසින්, පරිවාස නිලධරයකුගේ භාරයට නැතහොත් ප්‍රශ්නයට විෂය වී ඇති ළමයාට විශේෂ රැකබලා ගැනීමක් අවශ්‍යවන විටදී හෝ එසේ නොවුවද, එම රැකබලාගැනීම කිරීමට සුදුසුකම් ඇති වෙනත් යම් තැනැත්තකුගේ භාරයට පත්කරනු ලැබිය හැකිය.

ආයතනවල ආයතන.

5. මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින්, සහතික කළ පාසැල්, රිමාන්ඩ් නිවාස, ළමා නිවාස සහ ශෝධක මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය හැකිය.

සහතික කළ පාසැල් වර්ග කිරීම.

6. (1) 5 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබුවා වූද, අධිකරණ ආඥාවන් අනුව ළමයින් භාරගනු ලබන්නාවූද කවර හෝ සහතික කළ පාසැල්, ඒ පාසැල්වලට ඇතුළත් කර ගන්නා ළමයින්ගේ වයස් අනුව, ඒවායේ දී දෙනු ලබන අධ්‍යාපනයේ සහ පුහුණුවේ ස්වභාවය අනුව, වෘත්තීය පුහුණු කිරීම් අනුව, ළමයින් හැඩගැන්වීම සඳහා දෙනු ලබන විශේෂ උපදෙස් අනුව සහ භූගෝලීය පිහිටීම අනුව, අමාත්‍යවරයා විසින් වර්ගකරනු ලැබිය හැකිය. එම වර්ගීකරණය, ළමයකු පත්ව සිටින තත්වයට වඩාත්ම ගැළපෙන සහතික කළ පාසලකට ඔහු යවනු ලබන බව සහතික කර ගැනීම අරභයා සැළසුම් කළ යුතුය.

(2) යම් සහතික කළ පාසලක්:-

(අ) ඇතුලත් කිරීමට හෝ මාරු කිරීමට යෝජිත ළමයාගේ ආගමික දෘෂ්ටිය නොවන වෙනත් විශේෂිත ආගමික දෘෂ්ටියකට අයත් පාසලක් නම්; හෝ

(ආ) ඒ පාසලෙහි රඳවා ගැනීමට යුදුසුවන තරම් ළමයින් සංඛ්‍යාවක් ඒ වන විට එම පාසලෙහි රඳවා තබාගෙන සිටින බවට නැතහොත්, අවස්ථාවෝචිත පරිදි අන්‍යාකාරයෙන් තමාගේ රැකවරණය යටතේ සිටින බවට පාසලෙහි කළමනාකරු අමාත්‍යවරයා යැහීමට පත්කළ හොත් මිස,

මේ ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාර, සහතික කළ පාසලකට හෝ සහතික කළ පාසලක, කළමනාකරුගේ රැකවරණයට ඇතුළත් කරනු ලබන නැතහොත් මාරු කරනු ලබන කවර හෝ ළමයකු, එහි කළමනාකරු විසින් භාරගනු ලැබිය යුතුය.

ළමා නිවාස.

7. අනාථ ළමයින්, අත්හළ ළමයින්, අසරණ ළමයින්, සදාචාරය පිළිබඳ වරදකට ගොදුරුව යැමට දෘශ්‍යමාන මගක් නොමැතිව, ගෘහරහිතව සිටින ළමයින් හෝ රැකවරණය හෝ ආරක්ෂාව අවශ්‍ය ළමයින්, කිසිදු ළමා නිවාසයක් විසින් අධිකරණ ආඥාවකට අනුකූලව හෝ ලේකම්වරයා ගේ නැතහොත් බලයලත් නිලධරයාගේ එකඟත්වය ඇතිව මිස, භාර නොගත යුතුය.

"භාරය හා ආරක්ෂාව අවශ්‍ය" යන්නෙහි අර්ථකථනය.

8. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා "භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමයා" යන්නෙන් -

/....5

(ඈ) දෙමාපියන් හෝ භාරකරුවකු නොමැති වීමෙන් නැතහොත් රැකවරණය සහ භාරකාරත්වය දැරීමට අයෝග්‍ය හෝ කිසි රැකවරණය සහ භාරකාරත්වය ලබා නොදෙන දෙමාපියන් හෝ භාරකරුවකු සිටීමෙන්, නුසුදුසු සමාගමයට වැටීගෙන යන්නා වූ හෝ සදාචාරය පිළිබඳ අන්තරාවකට නැතහොත් එය ඉක්මවා යන අන්තරාවකට පාත්‍රවීමට ඉඩ ඇත්තා වූ ළමයකු, හෝ

(ආ) (1) පළමුවන උපලේඛණයේ සඳහන් තවර හෝ වරදක් තමා සම්බන්ධයෙන් කරනු ලැබ ඇති ළමයකු , හෝ

(II) එවැනි වරදක් තමා සම්බන්ධයෙන් සිදු කරනු ලැබ තිබෙන ළමයකු සමග එකම නිවසෙහි සාමාජිකයකුව සිටින ළමයකු , හෝ

(III) ළමයකු සම්බන්ධයෙන් එවැනි වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තකු සමඟ එකම නිවසෙහි සාමාජිකයකු වී සිටින ළමයකු , හෝ

(IV) නිවසේ වෙනත් ගැහැණු සාමාජිකයකු සම්බන්ධයෙන් විවාහ ලියා පදිංචි කිරීමේ ආඥා පනතේ 17 වන වගන්තිය යටතේ වූ වරදක්, නිවසේම සාමාජිකයකු විසින් සිදු කරනු ලැබ තිබෙන නිවසක ගැහැණු ළමයකු , හෝ

(V) ගෘහ සේවයේ යොදවා සිටින ළමයකු හෝ අදහස් වේ.

/.....6

(2) ළමයකු අසරණව සිටියදී හෝ නියමිත වාසස්ථානයක් සහ යැපීමට දෘෂ්‍යමාන මගක් නොමැතිව ඉබාගාතේ ඇවිදිමින් සිටියදී හෝ (ගී ගැයීමේ, ක්‍රීඩා කිරීමේ, රඟ දැක්වීමේ හෝ යමක් විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේ ව්‍යාජයෙන් වුවද එසේ නොමැතිව වුවද) සිඟමන් යදිමින් හෝ පිනට දෙන දේ ලබා ගනිමින් සිටියදී හෝ එසේ සිඟමන් යැදීම සඳහා නැතහොත් පිනට යමක් ඉල්ලීම සඳහා නිතරුනේ හැසිරෙමින් සිටියදී හමුවීම, (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවලට ව්‍යාප්තියට හානියක් නොමැතිව, ඔහු සදාචාරය පිළිබඳ අන්තරාවකට පාත්‍රවීමට ඉඩ ඇත්තකු බවට සාක්ෂියක් ලෙස, මේ වගන්තියේ කාර්ය සඳහා සැලකිය යුතුය.

## 111වන කොටස-ස්වේච්ඡා සංවිධාන

ස්වේච්ඡා සංවිධාන විසින් පිහිටුවන ආයතන අනුමත කිරීම

9. (1) ස්වේච්ඡා සංවිධාන විසින් පිහිටුවා පවත්වාගෙන යන යම් ආයතනයක් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින්, අනුමත කරනු ලැබිය හැකිය.

(2) 5වන වගන්තිය අනුව, සහතික කල පාසැලක කාර්ය ඉටුකර ගැනීම සඳහා යම් ස්වේච්ඡා සංවිධානයක් විසින් පිහිටුවා පවත්වාගෙන යන යම් ආයතනයක්, අනුමත පාසලක් ලෙස ලියා පදිංචි කළ හැකිය.

(3) යම් ස්වේච්ඡා සංවිධානයක් විසින් පිහිටුවා පවත්වාගෙන යන ළමා නිවාසයක් ස්වේච්ඡා ළමා නිවාසයක් ලෙස ලියා පදිංචි කළ හැකිය.

(4) ස්වේච්ඡා ළමා නිවාසයක් විසින් අනාථ සහ අසරණ ළමයින් සඳහා -

(අ) ඉඩ පහසුකම් සහ නඩත්තුව,

/...7

(ආ) වෛද්‍ය පහසුකම් සඳහා අවශ්‍යතාව උද්ගත වූ විට, ඒ පහසුකම්,

(ඇ) අධ්‍යාපනය හා යෝග්‍ය වෘත්තීන්හි පුහුණුව සැපයිය යුතුය.

(5) (අ) නිසි අධිකරණයක විධානයක් මත මිස, හෝ

(ආ) ළමයකු ඇතුළත් කිරීම ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන්නේ නම් මිස,

කිසිම ළමයකු ස්වේච්ඡා ළමා නිවාසයකට ඇතුළත් කර නොගත යුතුය.

(6) මේ වගන්තියේ (3) වන සහ (4) වන උප වගන්තිය අනුව පවත්වා ගෙන යනු ලබන යම් ආයතනයක් හෝ නිවාසයක්, පරිවාස භාරයට නියම කරනු ලබන ළමයින් සඳහා අනුමත නිවාසයක් ලෙස ලියා පදිංචි කරනු ලැබිය හැකිය.

(7) වයස අවුරුදු පහට අඩු ළමයින් දිවා කාලයේදී රැකබලා ගැනීමේ කාර්යය සඳහා ස්වේච්ඡා සංවිධානයක් විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන යම් ආයතනයක් 'දිවා රැකවරණ ආයතනයක්' ලෙස ලියා පදිංචි කළ හැකිය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

10. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ලියා පදිංචිය සඳහා එවන සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ගාස්තුව ගෙවා, නියමිත ආකෘතියෙහි, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, නියම කරනු ලැබිය හැකි ලියවිලි වෙතොත් ඒවාද සමග එවිය යුතුය.

(2) අදාළ ස්වේච්ඡා සංවිධානය , නියමයන් අනුව ක්‍රියා කර තිබෙන බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වුවහොත්, ඔහු ඒ ඉල්ලුම්පත්‍රය, ඔහුගේ නිර්දේශ ය සහිතව, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යවරයා විසින් , ඒ ඉල්ලුම්පත්‍රය අනුමත කරනු ලැබූ පසු, රෙජිස්ට්‍රාර්වරයා, අප්‍රමාදව එම සංවිධානය ලියා පදිංචි කර ලියා පදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්, අදාල ආයතනයේ කළමනාකරු වෙත නිකුත් කළ යුතුය.

(3) එසේ ලියා පදිංචි කරන ලද යම් සංවිධානයක තත්වය හෝ පාලනය පිළිබඳව යම් අවස්ථාවකදී, රෙජිස්ට්‍රාර් වරයා අතෘප්තියට පත්වුවහොත්, ඔහු විසින්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව ඒ ආයතනයේ ලියා පදිංචිය අවලංගු කළහැකි අතර, ඒ අවලංගු කිරීම, කළමනාකරු වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතුය.

ලියා පදිංචිය පිළිබඳ සාක්ෂි.

11.(1) ස්වේච්ඡා සංවිධානයක ලියා පදිංචිය අවලංගු කර තිබෙන බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, රෙජිස්ට්‍රාර් වරයා විසින් අත්සන් කරන ලද ලියා පදිංචි කිරීමේ සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් වන ස්වේච්ඡා සංවිධානය යථා පරිදි ලියා පදිංචි කර තිබෙන සංවිධානයක් බවට තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

(2) ලියා පදිංචි ස්වේච්ඡා සංවිධානයක හෝ ඒ සංවිධානයක් විසින් පාලනය කර පවත්වාගෙන යන යම් ආයතනයක හෝ කළමනාකරණ තත්ත්වයක් පිළිබඳ යම් අවස්ථාවකදී අමාත්‍යවරයා අතෘප්තියට පත් වුවහොත් හෝ එම ලියා පදිංචිය අවශ්‍ය නොවන බව ඔහු විසින් සලකනු ලැබුවහොත්, ඔහු විසින් කළමනාකරු වෙත භාරකරවන නියමයක් මගින්, එම දැන්වීමේ නිශ්චය කොට දක්වෙන්නා වූද දැන්වීමේ දින සිට මාස හයකට වඩා අඩු නොවන දිනයක් වූ ද එසේ නිශ්චිත දිනයක සිට ලියා පදිංචිය අවලංගු කළ හැකිය.

(3) 10(3) හෝ 11(2) වගන්තිය යටතේ කරන අවලංගු කිරීමක් අනුමත පාසලක් සම්බන්ධයෙන් වනවිට, එසේ ලියා පදිංචිය අවලංගු කරනු ලබන අවස්ථාවේ ඒ පාසලෙහි නේවාසිකව සිටින සියලුම ළමයින්, ලේකම්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් බලයලත්, නිලධාරයකු විසින් හෝ වෙනත් අනුමත පාසලකට නැතහොත් සහතික කල පාසැලකට යවනු ලැබිය යුතුය.

(4) 10(3) හෝ 11(2) වගන්තිය යටතේ කරන අවලංගු කිරීමක් ස්වේච්ඡා ළමා නිවාසයක් සම්බන්ධයෙන් වන විට, එසේ ලියා පදිංචිය අවලංගු කරනු ලබන අවස්ථාවේ ඒ පාසලෙහි නේවාසිකව සිටින සියලුම ළමයින්, ලේකම්වරයා විසින් හෝ යම් බලයලත් නිලධරයකු විසින් හෝ වෙනත් ඒ හාසමාන ළමා නිවාසයකට යවනු ලැබිය යුතුය.

(5) 10(3) හෝ 11(2) වගන්තිය යටතේ කරන අවලංගු කිරීමක්, ස්වේච්ඡා සංවිධානයක් සම්බන්ධයෙන් වන විට මුදල්ද ඇතුළුව යම් චංචල දේපළක් වෙතොත් එය එසේ භාරකරන සියළු අයිතමයන්හි ඉන්වෙන්ටරියක්ද සමග ළමයින් භාර දෙනු ලබන ආයතනයේ කළමනාකරුට, ලේකම්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් බලයලත් නිලධරයකු විසින් හෝ භාරදිය යුතුය.

(6) යම් ස්වේච්ඡා ළමා නිවාසයක් හෝ අනුමත පාසලක් යම් නිශ්චිත ආගමකට අයත් ළමයින් සඳහා පවත්වනු ලබන විටදී, වෙනත් යම් ආගමකට අයත් කිසිම ළමයකු, ඒ ළමා නිවාසයට හෝ අනුමත පාසැලට ඇතුළත් නොකළ යුතුය. ළමයකුගේ ආගම නිශ්චය කරනු ලබන්නේ ඒ ළමයාගේ දෙමාපියන්ගේ ආගමට අනුකූලවය.

රෙජිස්ට්‍රාර්-වරයාගේ බලතල.

12. රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් තත් කාර්යය සඳහා බලය පවරනු ලබන යම් නිලධරයකුට—

(අ) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කර තිබෙන යම් ස්වේච්ඡා සංවිධානයක් විසින් සතුටුදායක සේවා ප්‍රමිති පවත්වාගෙන යන්නේද යන වග ඇනගැනීමේ කාර්යය සඳහා, දවසේ සියළු යුක්තිසහගත වේලාවන්හිදී ඒ සංවිධානයේ පරිශ්‍රයට ඇතුළුවීමට සහ එය පරීක්ෂා කිරීමටද,

/...10

(ආ) එවැනි සංවිධානයක් විසින් කරන ලද බවට චෝදිත වැරදි හෝ අරමුදල් අවනතුකර ගැනීම් පිළිබඳව අමාත්‍යවරයාාට දැනුම් දීමට.,

සහ

(ඇ) එවැනි සංවිධානයක විධායක කාරක සභාවේ සියළුම සාමාජිකයන්ගේ නැතහොත් බහුතර සාමාජිකයන්ගේ ලිඛිත ඉල්ලීමක් මත හෝ ඒ සංවිධානයක නිලධරයන්ගේ නැතහොත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ ඒ සංවිධානයක යම් විධායක කාරක සභා රැස්වීමකට හෝ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමකට හෝ සහභාගිවීමටද,

බලය ඇත්තේය.

අමාත්‍යවරයා විසින් ඇතැම් කරුණු පරීක්ෂණ මණ්ඩලයට යොමු කළ හැකි බව.

13. මේ ප්‍රඥප්තිය යටතේ ලියා පදිංචි කර තිබෙන යම් ස්වේච්ඡා සංවිධානයක් සම්බන්ධයෙන්, වරදක් හෝ අවනතුකර ගැනීම පිළිබඳ චෝදනාවක් යම් තැනැත්තකු විසින් නගන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් ඒ කාරණය පරීක්ෂණ මණ්ඩලයකට යොමු කරනු ලැබිය හැකිය.

පරීක්ෂණ මණ්ඩලය.

14. (1) අමාත්‍යවරයා විසින්, රාජ්‍ය නිලධාරයන් නොවන, පිළිගැනීමක් සහිත තැනැත්තන් හයදෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයක් පත් කළ යුතුය.

(2) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින්, මූල මණ්ඩලයෙන් තෝරා ගන්නා සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් හෝ එක් එක් මණ්ඩලය තිදෙනෙකුගෙන් බැගින් සමන්විත වන පරීක්ෂණ මණ්ඩල හෝ සංස්ථාපනය කරනු ලැබිය හැකිය. ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය හැකිය.

/...11

(ඇ) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා දකුණු පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්,

(ඈ) විදේශ රටවලින් ආධාර වශයෙන් ලැබෙන සියලු මුදල්,

(ඉ) යම් තැනැත්තකු විසින් අරමුදලට පරිත්‍යාග වශයෙන් ලබා දෙන සියලු මුදල්,

(ඊ) වෙනත් කවර හෝ ප්‍රභවයකින් ලැබෙන මුදල් ඒ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

අරමුදලෙන් ගෙවීම්.

18. මේ ප්‍රඥප්තියේ 17 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ළමාරක්ෂක අරමුදලේ බැරට ඇති මුදලින් , ලේකම් වරයා විසින් හෝ තත් කාර්ය සඳහා බලය දෙනු ලැබ තිබෙන නිලධාරියකු විසින්, යම් ස්වේච්ඡා ආයතනයක කළමනාකරුට, ඒ නිවාස නිසි පරිදි හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන්, කලින් කල ගෙවනු ලැබිය හැකිය.

චංචල සහ නිශ්චල දේපළ පරිත්‍යාග කිරීම.

19. ළමාරක්ෂක අරමුදලට කරනු ලබන, යම් චංචල හෝ නිශ්චල දේපළ ඇතුළත් කවර හෝ පරිත්‍යාගයක්, මේ ප්‍රඥප්තියේ විධි විධානවලට අනුකූලව උපයෝගී කරගනු පිණිස, ළමාරක්ෂක අරමුදල වෙනුවෙන්, අමාත්‍යවරයා විසින් භාරගනු ලැබිය හැකිය. එවැනි කවර හෝ දේපළක් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සහ ඔහු තීරණය කරන ආකාරයට විකුණනු ලැබිය හැකි අතර, එම විකිණීමෙන් ලැබෙන මුදල් අරමුදලට භාරකරනු ලැබිය යුතුය.

අරමුදලේ පරිපාලනය

20(1) අරමුදල අමාත්‍යවරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ විය යුතු අතර, එය අමාත්‍යවරයාගේ උපදෙස්වලට යටත්ව ලේකම් වරයා විසින් පරිපාලනය කරනු ලැබිය හැකිය.

(2) එක් එක් ලිත් වර්ෂය අවසානයෙන් පසුව, ප්‍රායෝගිකව කළහැකි තාක් ඉක්මනින්, ලේකම්වරයා විසින්, අරමුදල පරිපාලනය පිළිබඳව වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතුය.

(3) ලේකම් වරයා විසින් එක් එක් ලිත් වර්ෂයට අදාළව, අරමුදලේ අංග සම්පූර්ණ සහ නිසි ගිණුමක් පවත්වා ගැනීමට සැලැස්විය යුතුය.

(4) අරමුදලේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතුය.

(5) අරමුදලේ පරිපාලනය පිළිබඳව එක් එක් වර්ෂය සඳහා වූ වාර්තාවක්, ඒ ඒ වර්ෂය හා සම්බන්ධ විගණනය කළ ගිණුම්වල පිටපතක්ද ඒ ගිණුම් පිළිබඳව විගණකාධිපති වරයාගේ වාර්තාවද සමඟ අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉක්මනින්, දකුණු පළාතේ පළාත් සභාව හමුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

## Vවන කොටස- පොදු විධි විධාන.

ආණ්ඩුවේ සියලු අදාල ආයතන 5 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේ සැලකෙන බව.

21 (1) දකුණු පළාත් සභාවේ පරිපාලන සීමා ඇතුලත පිහිටා ඇත්තාවූද, මේ ප්‍රඥප්තිය බලාත්මක වීමේදී හෝ ඊට පූර්වයෙන් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරන ලද්දාවූද ආණ්ඩුවේ සියලු ආයතන, මේ ප්‍රඥප්තියේ 5 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආයතන සේ සැලකිය යුතුය.

(2) දකුණු පළාත් සභා සීමා ඇතුලත පිහිටියා වූද මේ ප්‍රඥප්තිය බලාත්මක වන දිනයේදී හෝ ඊට ප්‍රථම වෙනත් යම් නීතියක් යටතේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වරයා විසින්, පරිපාලනය කළා වූ හා ලියා පදිංචි කරන ලද්දා වූ ද සියලු ස්වේච්ඡා ආයතන, සහ ඒ ආයතන පවත්වාගෙන ගිය සියලු ස්වේච්ඡා, සංවිධාන පිළිවෙලින් මේ ප්‍රඥප්තියේ 9 (1) වන වගන්තියේ සහ 16 වන වගන්තියේ කාර්ය සඳහා පිහිටුවන ලද ආයතන ලෙස, මේ ප්‍රඥප්තිය බලාත්මක වූ අවස්ථාවේ පටන්, සහ මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

නියෝග:

22 (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධි විධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උප වගන්තියේ පැවරෙන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොවැත්ව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යමක් හෝ පිළිබඳව නියෝග සා දනු ලැබිය හැකිය.

(අ) නියම කළයුතු යැයි මේ ප්‍රඥප්තියෙන් ප්‍රකාශිත හෝ නියමිත නැතහොත් නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය යටතේ බලය පැවරී ඇති සියලු කරුණු,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ ලියා පදිංචි කිරීම සිදු කළයුතු ආකාරය සහ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතු ගාස්තු හා ලියකියවිලි,

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන සහතිකයේ ආකෘතිය,

(ඈ) රෙජිස්ට්‍රාර්වරයා විසින් තබාගත යුතු පොත්පත් සහ ලේඛන සහ ඒවායේ ඇතුලත් කළයුතු විස්තර සහ,

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන ළමා නිවාස සහ වෙනත් ආයතන පරීක්ෂා කිරීමේ කාර්ය පටිපාටිය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දිනයේ සිට හෝ නියෝගයෙහි නිශ්චය කොට දැක්වෙන යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක වන්නේය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, එම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසුව හැකිතාක් ඉක්මනින් දකුණු පළාත් සභාව වෙත, අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක්, එය අනුමත කිරීම ප්‍රතික්ෂේප වූ දින පටන්, පරිච්ඡින්න කරන ලද නිසිවතට ඉන් හානියක් නොවිය යුතුය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකෙන්නේ යම් දිනයක පටන්ද ඒ දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

වැරදි: 23 මේ ප්‍රඥප්තියේ තවර හෝ විධි විධානයන් උල්ලංඝණය කරන යම් තැනැත්තකු නිසි අධිකරණය බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් හෝ මාස හයකට නොවැඩි කාලයකට බරපතල වැඩ නොමැතිව බන්ධනාගාර ගත කරනු ලැබීම හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

/....16.

මේ ප්‍රඥප්තිය වෙනත් ලිඛිත නීති අභිබවා බලපවත්වන බව.

24. වෙනත් යම් ලිඛිත නීතියක, පටහැනිව කවර විධි විධානයන් තිබුනද ඒ නොතකා මේ ප්‍රඥප්තියේ විධි විධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව මේ ප්‍රඥප්තියේ සහ ඒ වෙනත් නීතියේ විධි විධාන අතර, යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් තිබුණහොත්, මේ ප්‍රඥප්තියේ විධි විධාන බලපවත් වන්නේය.

අනනුකූලතාවක් ඇතිවිට සිංහලපාඨය බලපැවැත්විය යුතු බව.

25. මේ ප්‍රඥප්තියේ සිංහල හා වෙනත් යම් භාෂා පාඨ අතර, අනනුකූලතාවක් තිබුනහොත්, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අර්ථ නිරූපනය.

26. මේ ප්‍රඥප්තියෙහි, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස,

" **අත්හළ** ළමයා " යන්න නීත්‍යානුකූල දරුවකු සම්බන්ධව යෙදෙනවිට, දෙමාපිය දෙදෙනා විසින්ම අත්හැර දමන ලද හෝ දෙමාපිය දෙදෙනාගෙන් කෙනෙකු මියගොස් හෝ දෙමාපිය කෙනෙකු ලෙස ක්‍රියා කිරීමට අපොහොසත්ව සිටින්නේ නම් දෙමාපිය දෙදෙනාගෙන් අනෙක් තැනැත්තා විසින් අත්හැර දමන ලද ළමයකු අදහස් වන අතර, නීත්‍යානුකූල නොවන දරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, මව විසින් අතහැර දමන ලද ළමයකු නැතහොත් මව දෙමාපිය කෙනෙකු ලෙස ක්‍රියා කිරීමට අපොහොසත්ව සිටින්නාවූ ළමයකු ඉන් අදහස් වීය.

" අනාථ ළමයා" යන්න නීත්‍යානුකූල දරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට දෙමාපිය දෙදෙනාම මියගොස් හෝ දෙමාපිය දෙදෙනාගෙන් කෙනෙකු මිය ගොස් සහ අනෙක්

/...17.

තැනැත්තා දෙමාපිය කෙනෙකු ලෙස ක්‍රියා කිරීමට අපොහොසත්ව සිටින ළමයකු අදහස් වන අතර, නීත්‍යානුකූල නොවන දරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට මව මිය ගොස් සිටින ළමයකු අදහස් වේ.

'අසරණ ළමයා' යන්නෙන් අදහස් කරනුයේ:

1. රජයේ දෙපාර්තමේන්තුවක් මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලබන මහජන සහනාධාර ලබන දෙමව්පියන්ගේ දරුවෙක්.

II. රජය මගින් ප්‍රදානය කරනු ලබන ආහාර මුද්දර ලබන දෙමාපියන්ගේ දරුවෙක්.

III. එක් සාමාජිකයකු වෛද්‍ය සහතිකයක් අනුව ආදායම් මාර්ගයක් ලබාගත නොහැකි රෝගී තත්ත්වයක සිටින හා අනෙක් තැනැත්තා/තැනැත්ති (මව හෝ පියා) ප්‍රමාණවත් ආදායමක් නොලබන පවුලක දරුවෙක්,

IV. එක් මාපියකු බන්ධනාගාර ගතව සිටින හා අනෙක් තැනැත්තා/තැනැත්ති (මව හෝ පියා) ප්‍රමාණවත් ආදායමක් නොලබන පවුලක දරුවෙක්,

V. එක් මාපියකු වෛද්‍ය සහතිකයක් මත මානසික රෝගියකු යැයි නිශ්චය කර ඇති සහ අනෙක් තැනැත්තාට/තැනැත්තිට (මව හෝ පියා) ප්‍රමාණවත් ආදායමක් නැති පවුලක දරුවෙක්.

VI. උසාවි නියෝගයක් මත හෝ වෙනත් ආකාරයකින් දෙමාපියන් වෙන් වූ සහ ළමුන්ගේ භාරකාරත්වය දරණ මවට හෝ පියාට ප්‍රමාණවත් ආදායමක් නොමැති පවුලක දරුවෙක්.

'අනුමත පාසල' යන්නෙන් ළමයින් සහ යොවුනයන් පිළිබඳ ආඥාපනතේ (23 වන අධිකාරය) 50 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ පාසලක් අදහස් වේ.

(....18.

'අමාත්‍යවරයා' යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාවෙහි ප්‍රධාන අමාත්‍යවරයා විසින් පරිවාස හා ළමාරක්ෂක විෂයය හෝ කර්තව්‍ය පවරනු ලැබ සිටින අමාත්‍යවරයා අදහස් වේ.

'පරිවාස නිලධාරියා' යන්නෙන් වරදකරුවන් පරිවාස භාරයට පත් කිරීමේ ආඥාපනත (24 වන අධිකාරය) යටතේ පත් කරන ලද, වැටුප් ලබන හෝ වැටුප් නොලබන කවර හෝ පරිවාස නිලධරයෙක් අදහස් වේ.

'පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්' යන්නෙන් වරදකරුවන්ගේ පරිවාස භාරයට පත් කිරීමේ ආඥා පනත (24 වන අධිකාරය) යටතේ පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස් වරයා ලෙස හෝ එසේ ක්‍රියා කිරීම සඳහා හෝ තත් කාර්‍යයෙහි පත් කර සිටින තැනැත්තා අදහස් වේ.

'ළමයා' යන්නෙන් වයස අවුරුදු දහසයට අඩු ගැහැණු හෝ පිරිමි ළමයෙක් අදහස් වේ.

' සහතික කළ පාසැල' යන්නෙන් ළමයින් සහ යොවනයින් පිළිබඳ ආඥාපනතේ (23වන අධිකාරය) 51 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පාසලක් අදහස් වේ.

'ලේකම්' යන්නෙන්, දකුණු පළාතේ පලාත් සභාවෙහි, පරිවාස හා ළමාරක්ෂක විෂයය හෝ කර්තව්‍ය පවරනු ලැබ සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා අදහස් වේ.

## උප ලේඛණය – ( 8වන වගන්තිය)

ළමයින් විෂයෙහි සිදු කරන මේ ප්‍රඥප්තියේ විශේෂ විධි විධාන අදාල වන්නා වූ වැරදි,

1. දණ්ඩ නීති සංග්‍රහයේ 308 වන වගන්තිය හෝ 360 වන වගන්තිය යටතේ යම් වරදක්,

2. ළමයකු විෂයෙහි දණ්ඩ නීති සංග්‍රහයේ පහත දැක්වෙන යම් වගන්තියක් යටතේ සිදු කරන ලද වරදක් 296, 297, 343, 345, 357, 360අ, 364අ, 365, 365අ වගන්ති. සැ/.

3. ළමයකුට ශාරීරික පීඩාවක් ඇතුළත් වන වෙනත් යම් වරදක්.

1991 අගෝස්තු මස 05 වන දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මම මෙයින් සහතික කරමි.

[illegible]

සභාපති,
දකුණු පළාත් සභාව.

1991 ..සැප්තැම්බර්.. මස 02 වන දින,
ගාල්ලේ,
හිල්ටොප් මන්දිරයේ පිහිටි,
දකුණු පළාත් සභා කාර්යාලයේදී ය.